# ඉසුරුමුණිය තදාශ්‍රිතව පිහිටි රන්මසු උයන අනුරාධපුර පාලකයන්ගේ රාජකීය මංගල උද්‍යානය ද? ඓතිහාසික මූලාශ්‍රය නැවත කියවීමක්

එම්. කේ. ළසඳා අයිරාංගනී

## හැඳින්වීම

පුරාණ අනුරාධපුර නගරයේ බටහිර පාර්ශ්වයෙහි උතුරු දකුණු දිවෙන ගල් රැන්ද පාදක කරගනිමින් අභයගිරිය, මිරිසවැටිය, රන්මසු උයන, ඉසුරුමුණිය සහ වර්තමානයේ වෙස්සගිරිය නමින් හඳුන්වන විහාර සංකීර්ණයත් නිර්මාණය වී පවතින අතර බසවක්කුලම වැවෙහි කුඩා දූපත් කිහිපයක් ද නිර්මාණය වී ඇත. වගාවන් පිණිස භාවිත කළ නොහැකි ගල් සහිත නිසරු භූමියක් වන මෙහි ඇති ලෙන් ප්‍රාග් මානවයාගේ ජනාවාසයන් බව[1] සනාථ කරගෙන ඇති අතර මහින්දාගමනයෙන් අනතුරු ව එම ලෙන් භික්ෂු ආවාසයන් බවට පත් විය. ගල් රැන්දේ දකුණු පස කෙළවර භාවිත කරමින් නිර්මාණය වී ඇති ආරාම සංකීර්ණය වර්තමානයේ දී වෙස්සගිරිය සහ ඉසුරුමුණිය යනුවෙන් හඳුන්වයි. ඊට අයත් වූ පොකුණු පද්ධතිය ඇතුළත් භූමිය සෙනරත් පරණවිතානයන් විසින් රාජකීයන්ගේ මංගලෝද්‍යානය[2] වශයෙන් හඳුනාගෙන ඇත. හුදෙක් වෙස්සගිරිය සහ ඉසුරුමුණිය නමින් වර්තමානයේ දී ආරාම ද්විත්වයක් වශයෙන් සලකනු ලබන ආරාමය ඒකීය වූ විහාර සංකීර්ණයක් ය යන මතය තහවුරු කිරීමත් සමඟ ඒ ආසන්නයේ ම පිහිටන රන්මසු උයන රාජකීයන්ගේ විනෝද උද්‍යානයක් ය යන්න ගැටලුකාරී මතයකි.

ඒ අනුව මෙම පර්යේෂණයෙන් භූගෝලීය වශයෙන් එක් කලාපයක පිහිටා ඇති වෙස්සගිරිය, ඉසුරුමුණිය සහ රන්මසු උයන යන පුරාවිද්‍යා පරිශ්‍රයන් ත්‍රිත්වයෙහි ඇති ඒකීයභාවය අධ්‍යයනය කරමින් එය එක් විහාර සංකීර්ණයක් වශයෙන් හඳුනාගැනීමට හැකි ලක්ෂණ විමර්ශනය කරනු ලබයි. ඓතිහාසික මූලාශ්‍රය මත සහ පුරාවිද්‍යාත්මක


සාක්ෂි මත පදනම් වෙමින් එහි භික්ෂු පරම්පරාව, ආරාමික පරිපාලනය සහ ජල කළමනාකරණය පිළිබඳව අධ්‍යයනය කරමින් තර්කානුකූල මතවාදයන් මූලික කරගනිමින් රන්මසු උයන පර්යේෂණයට භාජනය කරනු ලබයි. එහි දී සෙනරත් පරණවිතානයන්ගේ මතවාදයට අනුව මෙය රාජකීය මංගලෝද්‍යායනය වන්නේ ද? නැතහොත් ආරාමික ජල උද්‍යානයක් ද? යන්න ගැඹුරින් විග්‍රහ කිරීමට හැකියාව ඇත.

**ක්‍රමවේදය**

මෙම අධ්‍යයනයේ දී වෙස්සගිරිය, ඉසුරුමුණිය සහ රන්මසු උයන යන ක්ෂේත්‍රයන් සියුම්ව නිරීක්ෂණය කරන ලද අතර එහිදී හඳුනාගත් ඇතැම් කරුණු තහවුරු කරගනු වස් මහාවිහාරය, මිරිසවැටිය, අභයගිරිය සහ බටහිර ආරාම ආදි වූ පුරාවිද්‍යා පරිශ්‍රයන්හී පවතින ඓතිහාසිකමය සහ පුරාවිද්‍යාත්මක සාධක ද අධ්‍යයනයට බඳුන් කරන ලදි. මෙහිදී නූතන ව්‍යවහාරයේ වෙස්සගිරිය යනුවෙන් හඳුන්වන පරිශ්‍රයෙන් හමුවන සෙල්ලිපි මූලාශ්‍රය ප්‍රමුඛතම සාක්ෂියක් වශයෙන් භාවිත කෙරෙන අතර **දීපවංසය, මහාවංසය, බෝධිවංසය, වංසත්ථප්පකාසිනිය** සහ **සහස්සවත්ථුප්පකරණය** ආදි පුරාතන සාහිත්‍ය මූලාශ්‍රයන්හි සඳහන් තොරතුරු ගැඹුරින් අධ්‍යයනය කරයි. බ්‍රිතාන්‍ය පාලන අවධියේ දී මෙම පුරාවිද්‍යා ක්ෂෙත්‍රයන් පාදක කරගනිමින් ලියැවුණු පාලන වාර්තා, පුරාවිද්‍යා වාර්තා සහ විවිධ විදේශික ලේඛකයන් විසින් සිදුකරන ලද වාර්තාවන් ද ඔවුන්ට සමකාලීනව දේශීය උගතුන් විසින් රචනා කරන ලද ග්‍රන්ථ කෙරෙහි ද අවධානය යොමු කරයි. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව පිහිටුවීමෙන් අනතුරුව එච්.සී.පී.බෙල්, ස්මින්දර්, කනින්හැම් ආදි විදේශිකයන් ද, සෙනරත් පරණවිතාන සූරීන්ගේ සිට අද දක්වාම දේශීය පුරාවිද්‍යාඥයන්ගේ මැදිහත්වීම් ද අධ්‍යයනයට භාජනය කර සියලුම අකාරවලින් ලබාගන්නා දත්ත මෙසේ එක්රැස් කරගත් දත්ත ඓතිහාසික සංසන්දනාත්මක ක්‍රමවේදයත් (Historical comparative Method), අන්තර්ගතය විශ්ලේෂණ ක්‍රමවේදයත් (Content Analysis) ඔස්සේ විශ්ලේෂණය කරමින් රන්මසු උයන යනු හුදෙක් රාජකීයන්ගේ මංගලෝද්‍යානය නොවන බව තහවුරු කළ හැකි වේ.

## සාකච්ඡාව

අධ්‍යයනයට භාජනය වන පුරාවිද්‍යා පරිශ්‍රය වර්තමානයේ වෙස්සගිරිය, ඉසුරුමුණිය සහ රන්මසු උයන යනුවෙන් හඳුන්වන භූමි භාගය වන අතර උතුරු අක්ෂාංශ 8° 19' 43"ට සහ නැගෙනහිර දේශාංශ 80° 23' 24"ට සමපාතවන ස්ථානයේ සහ තදාශ්‍රිත භූමියේ වෙස්සගිරිය ද, උතුරු අක්ෂාංශ 8° 20' 04"ට සහ නැගෙනහිර දේශාංශ 80° 23' 24"ට සමපාතවන ස්ථානය අවට කලාපයේ ඉසුරුමුණිය ද, උතුරු අක්ෂාංශ 8° 20' 17"ට සහ නැගෙනහිර දේශාංශ 80° 23' 23"ට සමපාත වන භූමියෙහි රන්මසු උයන ද ස්ථානගත වී ඇත. මෙම සමස්ත භූමිය උතුරින් මිරිසවැටියෙන් ද, නැගෙනහිරින් මල්වතු ඔය නිම්නයෙන් ද, දකුණින් කුඹුරුවලින් ද සීමා වි ඇති අතර එහි බටහිරපස සීමාව වන්නේ තිසා වැව සහ ඊට අයත් කුඹුරු යාය යි. උතුරු දකුණු විහිදෙන ගල් ඇන්දෙහි ස්ථාන කිහිපයකින් හඳුනාගත හැකි ගල් කළු කේන්ද්‍ර කරගනිමින් විවිධ ඉදිකිරීම් සිදුකර ඇත.




වර්තමාන නාමීකරණයන් සමඟ පිහිටීම **(https://www.googlemap.com)**

මෙම පුරාවිද්‍යා පරිශ්‍රයෙහි ඓතිහාසික පසුබිම වෙත අවධානය යොමු කිරීමේ දී ප්‍රාග් ඓතිහාසික අවධියේ පටන්ම ගල් ගුහා ආශ්‍රය කරගත් මානව ජනාවාස පැවති බව වර්තමානයේ වෙස්සගිරිය යනුවෙන් හඳුන්වන භූමි ප්‍රදේශයෙන් සාධක[3] හමු වේ. මහින්දාගමනයත් සමඟ එම ගල් ගුහා මනුෂ්‍ය වාසයට සුදුසු ලෙස සකස්කර භික්ෂු සංඝයාට පූජා කළ බව වෙස්සගිරිය පුරාවිද්‍යා පරිශ්‍රයෙහි හමු වන පූර්ව බ්‍රාහ්මී සෙල්ලිපි සාක්ෂි දරයි.[4] කටාරම් කොටන ලද ලෙන් ලිපිවල සඳහන් තොරතුරු අනුව ගමික, ගහපති, පරුමක වැනි සමාජයේ සිටි විවිධ තරාතිරම්වලට අයත්, විවිධ තනතුරු දැරූ පිරිස් භික්ෂූන් විෂයෙහි ලා මෙම ප්‍රදානයන් සිදුකොට ඇත. ස්වභාවික ගල් ආනතිය සහිතව නිර්මාණය වූ ගල්ලෙන් දක්නට නොමැති ඉසුරුමුණිය සහ රන්මසු උයන භූමියෙහි සියුම් ගල් ආනතිය උපයෝගී කරගනිමින් බිත්ති බැඳ ලෙන් නිර්මාණය කර ඇත.

ඓතිහාසික මූලාශ්‍රයන්හී සඳහන්වන ආකාරයට දේවානම්පියතිස්ස රජු (ක්‍රි.පූ.247-207) විසින් වෙස්සගිරිය සහ ඉසුරුමුණිය[5] නමින් විහාර ද්විත්වයක් කරවා ඇති අතර මෙහි සඳහන්වන වෙස්සගිරිය පිළිබඳව නැවත සඳහන් වනුයේ වළගම්බා (ක්‍රි.පූ.104-76) රාජ්‍ය සමයේ දී ය. ද්‍රවිඩ ආක්‍රමණ හමුවේ අනුරාධපුරය හැර පලා ගිය වළගම්බා රජු වෙස්සගිරිය වනයේ සැඟවී සිටි බව[6] මහාවංසයෙහි සඳහන් වන අතර අනුරාධපුරයට ඉතාමත් ආසන්න වර්තමාන වෙස්සගිරිය එසේ සැඟව සිටීමට සුදුසු වූයේ ද යන්න ගැටලුවකි. ඒ අනුව සී.ඩබ්.නිකලස් සූරීන් පෙන්වා දී ඇත්තේ වෙස්සගිරිය යනු වර්තමානයේ එනමින් හඳුන්වන ස්ථානය නොව ගල්ගමුව ආසන්නයේ පවතින භූමියක් බවයි.[7] වළගම්බා රජුගෙන් අනතුරුව වෙස්සගිරිය පිළිබඳ කිසිදු සාක්ෂියක් මූලාශ්‍රය සාධකවලින් තහවුරු කරගැනීමට නොහැකිය. මේ අනුව වර්තමානයේ වෙස්සගිරිය නමින් හඳුන්වන බිමෙහි ඇති පුරාවිද්‍යාත්මක අවශේෂ සහ වරින් වර ලියැවී ඇති සෙල්ලිපි අනුව මෙය ඉසුරුමුණිය නමින් හඳුන්වා ඇති අතර පෙර සඳහන් කළ නිකලස් සූරීන්ගේ මතවාදය තහවුරු කිරීමට එය ප්‍රබල සාධකයක් වේ. වර්තමාන වෙස්සගිරියෙන් හමුවන මහානාග රජුගේ (ක්‍රි.පූ.62-50) සෙල්ලිපියක[8] සහ කුටුම්බික බුතියගේ පර්වත ලිපියක[9] "ඉසිරමණ" යනුවෙන් ද, සහවරල සලමෙය සහ සකණකන වෙසිමිණියගේ සෙල්ලිපියක[10] "අබ කසබගිරිය"

යනුවෙන් ද, සිව්වැනි මිහිඳු රජුගේ වෙස්සගිරිය පුවරු ලිපියෙහි[11] "ඉසුරමෙනු බොළුපුල්වන් කසුප්ගිරි රද්මහවෙහෙර" යනුවෙන් ද සඳහන් කර ඇති හෙයින් අද වනවිට වෙස්සගිරිය නමින් හඳුන්වන මෙම භූමිය පැරණි ඉසුරුමුණි විහාරය බැව් හඳුනාගත හැකි ය. ඉසුරුමුණිය විහාරය සම්බන්ධ ව ලියැවී ඇති සාහිත්‍ය මූලාශ්‍රයගත සාධක සහ සෙල්ලිපි සාධක අනුව එය උපෝසථඝරය, දානශාලාව, බෝධිඝරය, ස්තූප ආදි වූ සියලුම ආකාරයේ විහාරාංගවලින් පූර්ණ වූ විශාල ප්‍රමාණයේ විහාර සංකීර්ණයක් බව හඳුනාගත හැකි වූවත් වර්තමානයේ ඉසුරුමුණිය නමින් හඳුන්වන බිම් කඩ ලෙන් කිහිපයකට සීමා වී ඇත. දේවානම්පියතිස්ස රජු විසින් කරවූ ඉසුරුමුණි විහාරයෙහි ශ්‍රී මහා බෝධියෙන් හටගත් අෂ්ටඵලරුහ බෝධි අංකුරයක් රෝපණය කළ බව[12] සඳහන්වන අතර වර්තමාන ඉසුරුමුණියෙහි හඳුනාගත හැකි බෝධිඝරය මහනුවර අවධියේ ලක්ෂණවලින් යුක්ත වේ. එහෙත් වෙස්සගිරිය නමින් හඳුන්වන භූමියෙන් අනුරාධපුර අවධියට අයත් බෝධිඝරයක නෂ්ටාවශේෂ හමුවේ. ඒ අනුව දේවානම්පියතිස්ස රජු විසින් රෝපණය කළ, කුටුම්බික බුතිය විසින් බෝධි ගෘහය කරවා දිව්සම් ඇතුරා[13] ඇති බෝධිය වර්තමාන ඉසුරුමුණියේ පවතින බෝධිගෘහය නොවන බවත් එය වර්තමාන වෙස්සගිරිය භූමියේ පවතින බෝධිගෘහය බවත් හඳුනාගත හැකි වේ. චන්ද්‍රමුඛසිව රජු (ක්‍රි.ව.44-52), වසභ රජු (ක්‍රි.ව.65-100) සහ වෝහාරිකතිස්ස රජු (ක්‍රි.ව.209-231) ද ඉසුරුමුණියට අනුග්‍රහයන් දක්වා ඇති[14] අතර වසභ රජු විසින් ඉසුරුමුණියේ කරවූ බවට සඳහන්වන උපෝසථඝරය වර්තමාන වෙස්සගිරියේ දකුණුපස කෙළවරෙහි හඳුනාගත හැකි උපෝසථඝරය බවට අනුමාන කළ හැකි වේ. මේ අනුව වර්තමානයේ වෙස්සගිරිය නමින් අදාල ක්ෂේත්‍රය සඳහා ලබා දී ඇති නාමීකරණය බැහැර කර සමස්ත සංකීර්ණය ම ඉසුරුමුණි විහාර සංකීර්ණය වශයෙන් තහවුරු කළ හැකි අතර **සහස්සවත්ථුප්පකරණයෙහි** ගෝඨයිම්බර කතා වස්තුවේ "තිස්ස වාපි මරියාදෙ ඉස්සරසමණ විහාරං අගමාසි"[15] යනුවෙන් ද, රසවාහිනිය[16] සහ **සද්ධර්මාලංකාර**[17] තිසා වැවට සමීපව ද ඉසුරුමුණිය පිහිටි බව දැක්වීම එම මතය වඩාත් ශක්තිමත් වේ.

මෙම පුරාවිද්‍යා පරිශ්‍රයෙහි උතුරු කෙළවරට අයත් රන්මසු උයන සාලිය කුමරු සහ අශෝකමාලාවන් හමු වූ උයන බවට ජන ව්‍යවහාරයේ සඳහන් වන අතර සිව්වැනි මිහිඳු රජුගේ

වෙස්සගිරිය පුවරු ලිපියෙහි එය රන්මසු උයන වශයෙන් හඳුන්වා ඇත.[18] ධාරා ගෘහයන් සහ කැටයම් සහිත අලංකාර පොකුණු යුගලයකින් ද, පධානඝරයකට සමාන ගොඩනැගිල්ලකින් ද, විශ්ව චක්‍රය නම් වූ කැටයමකින් ද, ලෙන් කිහිපයකින් ද සමන්විත රන්මසු උයන කැණීම් කර සංරක්ෂණය කරන ලද සෙනරත් පරණවිතානයන් මෙය රාජකීයන්ගේ මංගලෝද්‍යානය[19] ලෙසින් පෙන්වා දෙයි. මංගලෝද්‍යානය වශයෙන් මෙය හැඳින්වීමට සාධක වශයෙන් භාවිත කර ඇත්තේ සිව්වැනි මිහිඳු රජුගේ වෙස්සගිරිය සෙල්ලිපිය යි.[20] සෙල්ලිපියට අනුව තිසා වැවෙහි මොහොල්නග සොරොව්වෙන් පිට කරන ජලය රන්මසු උයනේ පොකුණුවලට හා ඉසුරුමුණි විහාරවාසී භික්ෂූන් උදෙසා භාවිත කර අතිරික්තය අනෙක් ස්ථානයන්ට මුදාහැරිය යුතු අතර අදාළ රාජකාරිය භාර කර ඇත්තේ "මඟුල් මහඋයන්කැමිටයි." මෙම මඟුල් මහ උයන්කැමි යන පාඨය පාදක කරගන්නා සෙනරත් පරණවිතානයන් එයින් රාජකීය උද්‍යාන භාර නිලධාරියා නියෝජනය වන බව දක්වමින් මෙම උද්‍යානය රාජකීය උද්‍යානය යන මතයට එළඹී ඇත.

එහෙත් රන්මසු උයනෙහි පිහිටීමත් එහි ඇති නිර්මාණාංගත් විමර්ශනය කිරීමේ දී මෙම භූමිය රාජකීය විනෝද උද්‍යානයකට සුදුසු වී ද යන ගැටලුව පැන නගියි. උතුරු පසින් මිරිසවැටිය විහාර සංකීර්ණයත්, ඊසාන දෙසින් දක්ඛිණ විහාරයත්, දකුණු පසින් ඉසුරුමුණි විහාර සංකීර්ණයත් පිහිටා තිබීම නිසා භාවනායෝගී භික්ෂූන් වහන්සේලාත්, අධ්‍යාපන කාර්යයන්හි නිරත භික්ෂූන් වහන්සේලාත් මේ අවට කලාපයේ බහුලව වාසය කරන්නට ඇති අතර එවන් වූ වටපිටාවක් මධ්‍යයයේ ගිහියන්ගේ විනෝද ස්ථානයක් පැවතීම සමාජීය වශයෙන් සදාචාරාත්මක නොවේ. ඉසුරුමුණි විහාර සංකීර්ණයට සමීපව මෙම භූමිය පිහිටන අතර විනෝද වූයේ නම් එයින් ජනිතවන ඝෝෂාකාරීත්වය භික්ෂූන්ට හිරිහැරයක් වනු නොඅනුමාන ය.

වෙස්සගිරියේ සිට රන්මසු උයන දක්වාම තැනින් තැන ඉල්පී ඇති ගල් රැන්ද භාවිත කරමින් ලෙන් නිර්මාණය කර ඇති අතර රන්මසු උයනෙහි ගල් ආනතිය භාවිත කරමින් කටාර කෙටූ ලෙන් කිහිපයක්ම හඳුනාගත හැකි වේ. මෙසේ ලෙන් පැවතීම මෙම භූමිය භික්ෂු වාසස්ථානයක් වශයෙන් භාවිත කළ බව තහවුරු කෙරෙන

ප්‍රබල සාධකයක් වේ. සුළු ගල් ආනතියක් පවා භාවිත කරමින් ලෙන ඉදිරිපස කණු සිටුවා බිත්ති බැඳ ගල් ආනතිය සමග සම්බන්ධ කොට බාල්ක යොදමින් පියස්ස තනාගත් බවට සාක්ෂි වශයෙන් කණු පාදම්, බාල්ක රැඳවීමට කරවූ සිදුරු සහ බිත්ති බැඳ පැවති බවට සාධක පැහැදිලිවම හඳුනාගත හැකි වේ. එම ලෙන් පද්ධතියෙහි ලක්ෂණ සමස්ත ගල් රැන්දෙහිම ඇති ලෙන් සමඟ සමාන වන හෙයින් මෙම ලෙන් ද ක්‍රිස්තු පූර්ව අවධියෙහි හෝ ක්‍රිස්තු වර්ෂ මුල් ශතවර්ෂයන්හී දී කරවා ඇති බව අනුමාන කළ හැකි වේ. එහෙයින්ම මෙම භූමිය ආරම්භයේ පටන්ම භික්ෂු වාසස්ථානයක් බව තහවුරු වේ.

රන්මසු උයනෙහි හඳුනාගත හැකි පොකුණු මෙය රාජකීය උද්‍යානයක් බව තහවුරු කිරීමට ප්‍රබල සාධකයක් වශයෙන් භාවිත කරනුයේ එහි ඇති අලංකරණාංග හේතුවෙන් ය. ධාරා ගෘහ යනුවෙන් සාහිත්‍යයේ හැඳින්වෙන ගෘහයන්ට සමාන කුඩා කුටි,[21] අලංකාර ජල පිහිලි, විමාන ලක්ෂණ සහිත කැටයම්, නෙළුම් පිරි පොකුණක දිය කෙළියෙහි යෙදෙන හස්ති පන්තියක් නිරූපණය කෙරෙන කැටයම, එකිනෙක සම්බන්ධ ද්විත්ව පොකුණු පද්ධතිය සහ තිසා වැවේ සමෝච්ච රේඛාවට සමපාත වන දිය අගල ආදි වූ තාක්ෂණික ඉදිකිරීම් සමූහය අනුරාධපුර අවධියේ බිහි වූ උසස් නිර්මාණාංග වශයෙන් හඳුනාගත හැකි වේ. තිසා වැවෙන් පිටවන ජලය කුඩා දිය අලගක් ඔස්සේ රන්මසු උයනට යොමුකර ඇති අතර සමෝච්ච රේඛාවට අනුගත වන පරිදි එහි ගමන් මාර්ගය යොදමින් අලංකාර ශෛලමය පොකුණු ද්විත්වයටත්, දැනට වගුරක් ලෙසින් හඳුනාගත හැකි විශාල පොකුණු ද්විත්වයටත් යොමුකර ඇති අතර මෙම ශෛලමය පොකුණු ද්විත්වය ප්‍රමාණයෙන් කුඩා වේ. එහෙයින්ම රාජකීය පිරිසකට මෙය ප්‍රමාණවත් වන්නේ ද යන්න ද ගැටලුවකි.

බෞද්ධ දර්ශනයට අනුව භික්ෂූන් වහන්සේලාගේ ආධ්‍යාත්මික සංවර්ධනය පිණිස නිරත වන කසින භාවනාවන් දහයක් හඳුනාගත හැකි අතර මෙම දස කසිනයන් අතරට ජලය ද ඇතුළත් වී තිබේ.[22] සිත එකඟකරගනු වස් නිශ්චිත වස්තුවක් වෙත අවධානය යොමු කරමින් සිදු කෙරෙන කසින භාවනාවේ දී ජලය, ජලයේ සෙලවීම, ජලය ගලා යන හඬ, වර්ෂාව ආදිය පවා භික්ෂූන් උපයෝගී කරගන්නට ඇති අතර රන්මසු උයනෙහි ඇති ධාරා ගෘහයන්ගේ හිඳ භාවනාවේ යෙදෙන භික්ෂුවකට ගෘහයේ පියස්සෙන් ඇද හැලෙන ජල ධාරාව

ප්‍රබල ආලෝකයක් වූවා නිසැකය. නිරන්තරව ජලය ගලා බස්නා හඬ මෙහි ලෙන්වල වාසය කළ භික්ෂූන් ද තම ආධ්‍යාත්මික සංවර භාවය ඇතිකරගනු පිණිස භාවිත කරන්නට ඇත.

මහාවිහාර සංකීර්ණයෙහි සන්නිපාත ශාලාවට බටහිර දිශාවෙන් පිහිටුවා ඇති ජන්තාඝර පොකුණු යුගලයේ ද ධාරාගෘහ වශයෙන් පරණවිතානයන් පෙන්වා දී ඇති කුටිවලට සමාන කුටි යුගලය බැගින් හඳුනාගත හැකි හෙයින් මෙම කුටි හුදෙක් ලෞකික විනෝදයෙන් ඔබ්බට ගිය කිසියම් විනය හෝ ආධ්‍යාත්මික ක්‍රියාවක් සඳහා භාවිත කර ඇති බව තහවුරු කරගත හැකි වේ. රන්මසු උයනට නොදෙවැනි අලංකරණාංග එක් කරමින් පොකුණක තවත් පොකුණක් පිහිටන ආකාරයට මෙයින් එක් ජන්ථාඝර පොකුණක් කරවා ඇති අතර සංරක්ෂණය කර නොමැති අනෙක් පොකුණෙහි ද අලංකරණාංග පැවති බවට සාධක බහුල ය. අභයගිරියේ කුට්ටම් පොකුණ, ජේතවනාරාමයේ දක්නට හැකි පොකුණු, මහාවිහාර භූමියේ දක්නට හැකි අනෙකුත් පොකුණු ආදිය වෙත අවධානය යොමු කිරීමේ දී විහාරාරාම සතු පොකුණු විශිෂ්ට නිර්මාණ ලක්ෂණයන් සහිතව කරවා ඇති බව තහවුරු කරගත හැකි වේ. ඒ අනුව රන්මසු උයන හුදෙකලා නොකර සමස්ත ආරාම සංකීර්ණයන් වෙත අවධානය යොමු කිරීමේ දී මෙය ද භික්ෂූන්ගේ ප්‍රයෝජනය පිණිස කරවූවක් බව හඳුනාගත හැකි ය. මෙහි එක් පොකුණක නෙලා ඇති දිය කෙළින හස්ති පන්තිය ද වර්තමානයේ ඉසුරුමුණිය නමින් හඳුන්වන බිම් කඩෙහි දක්නට ඇති පොකුණෙහි හඳුනාගත හැකි හස්තීන්ට සමකාලීන වේ. මේ අනුව ඉසුරුමුණි විහාර සංකීර්ණයටම අයත් පොකුණු වශයෙන් මෙහි ඇති පොකුණු ද නම් කිරීම අසාධාරණ නොවේ.

රන්මසු උයනෙහි තිසා වැව් බැම්මට මුහුණලා ඇති ගල් බෙයඳක කටාරමට පහළින් නෙළා ඇති සංකේත සටහන ද මෙම උයන මගුල් උයන යන සංකල්පයෙන් ඔබ්බට ගිය ආධ්‍යාත්මික මධ්‍යස්ථානයක් වූ බවට නිදසුන් සපය යි. විශ්ව චක්‍රය යනුවෙන් හඳුන්වන්නා වූ මෙය කුඩා වෘත්ත හතකින් ආරම්භ වී විශාලනය වී ඇති අතර චක්‍රයෙහි පිටතින්ම ඇති තීරුවේ බෙල්ලන්, මාළුවන්, කකුළුවන් සහ මුහුදු අශ්වයන් වැනි සමුද්‍රවාසී සත්ත්වයින් නිරූපණය කර ඇත. ඇතුළත පවතින වෘත්තය චතුරස්‍රාකාර කොටස්වලට බෙදා

ඒවායෙහි කුඩා වෘත්ත කොටස් සහ හඳුනාගැනීමට අපහසු සංකේත සටහන් කිහිපයකි. චක්‍රය මධ්‍යයයේ දක්වන චතුරස්‍රයේ ක්‍රමයෙන් කුඩා වෙමින් යන ආකාරයට දක්වා ඇති වෘත්ත හතෙන් සප්ත මහා සාගරය සහ ඒ වෘත්ත මධ්‍යයයේ ඇති වෘත්තාකාර සලකුණින් සත්කුළු පව්වට මැදි වූ මහාමේරුවත් නිරූපණය කර ඇති බව දක්වන බෙල් විශාල චක්‍රය කොටස්වලට බෙදන චතුරස්‍රවලින් නිරූපණය කරන සංකේතයන්ගෙන් හිරු සඳුත්, බාහිර චක්‍රයේ ඇති ජලජ සත්ත්වයන්ගෙන් 'ජලජ ලෝකයත්' දක්වෙන බව සඳහන් කරයි.[23] '**කුලාර්ණව තන්ත්‍රය**' නමින් හඳුන්වන මහායාන ග්‍රන්ථය පිළිබඳව වුඩ්රෝ විල්සන් විසින් දක්වන අදහසක් අනුව යමින් මාර්ටින් වික්‍රමසිංහයන් පෙන්වා දෙනුයේ ක්‍රිස්තු වර්ෂ දහවැනි ශතවර්ෂයේ දී පමණ මෙරටට බලපෑ මහායාන ආභාසය නිසා නිර්මාණය වූ යන්ත්‍රයක් මෙසේ සටහන් කර ඇති බවයි.[24] ඩබ්.ඒ.ද සිල්වා විසින් 'කුවේර මණ්ඩලය'[25] මෙම චක්‍රය පෙන්වා දී ඇත. මෙම යන්ත්‍රය සටහන් කර ඇති ගල් බෙයදෙහි ඉහළින් සටහන් කර තිබූ "පණතිපණස" යන පාඨය කියවන්නට සමත් වූ සෙනරත් දිසානායකයන් විසින් අදාළ චක්‍රයෙහි පිටත තීරුවේ ජලජ සත්ත්වයන් විස්සක් ද, ඇතුළත සංකේත තිස් තුනක් ද ගණනය කළ හැකි බව පෙන්වා දෙමින් එහි එකතුව වන පනස් තුනක් එනම් ප්‍රාණීන් පනස් තුනක් මෙහි ඇති බවත් සෙල්ලිපියෙහි එය පණ තිපණස යනුවෙන් දක්වා ඇති බවත් විග්‍රහ කරයි.[26] ඒ අනුව මෙම ගල් බෙයඳ ඉදිරිපිට පිහිටි ගලෙහි කපා ඇති ආසන පහට අනුව ද මෙය විශ්වයේ ප්‍රාණය සිහි කරමින් භාවනා කිරීම පිණිස උපයෝගී කරගන්නට ඇතැයි ඔහු පෙන්වා දෙන අතර ඇතැම් විට වර්ෂාව අපේක්ෂාවෙන් යාතුකර්ම කළ ස්ථානයක් විය හැකි බවට ද පෙන්වා දී ඇත.

2019 වර්ෂයේදී අප විසින් අදාළ චක්‍රය සම්බන්ධව සිදුකළ සියුම් ගවේෂණයේ දී චක්‍රයේ පිටත තීරුවෙහි පොළොවට ලම්බක වන ස්ථානයේ සටහන් කර පැවති විශේෂ සංකේතයක් හඳුනාගත හැකි විය. පුළුල් උකුලකින් සහ පුන් පියයුරු යුගලකින් යුත් කාන්තා රුවක් වශයෙන් පෙනෙන මෙම සංකේතයට අනුව එය පිහිටි ස්ථානය ද සලකා බැලීමේ දී මෙම චක්‍රයේ ආරම්භය මෙම සලකුණ යැයි අනුමාන කළ හැකි ය. ඒ අනුව කාන්තාව හෙවත් මව (ජනනී) මූලික කරගනිමින් ප්‍රජනනය සහ සාගරයෙන් විශ්වය නිර්මාණය වන බවත්

එසේ විශ්වයට බිහිවන ප්‍රාණියා විවිධ සාංසාරික අභියෝග පරයමින් ක්‍රමයෙන් චක්‍රයෙන් චක්‍රයට සිත එකග කරගනිමින් එහි කේන්ද්‍රය වෙත පිවිසිය යුතු බව මෙම චක්‍රයේ පෙන්වා දෙතැයි අනුමාන කළ හැකිය. ඒ අනුව මේ ඉදිරිපිට ඇති ආසනයෙහි හිඳ ගන්නා භාවනායෝගීන් සමස්ත විශ්වයෙහි උපත සිහි කරමින් ක්‍රමයෙන් තම මනස දියුණු කරගනිමින් එහි උපරිම අවස්ථාවේදී කේන්ද්‍රීය ලක්ෂය තුළට පිවිසී ආධ්‍යාත්මික සුවය ලබාගන්නට ඇත. මේ ඉදිරිපිට ආසන පහක් පමණක් දක්නට ලැබීමත්, ඉඩකඩ සීමිත වීමත්, ස්වභාවිකවට අවට පරිසරයෙන් හුදෙකලාව පැවතීමත් යන ලක්ෂණ වෙත අවධානය යොමු කිරීමේ දී මෙම ස්ථානය ආධ්‍යාත්මික දියුණුවක් ලබාගත් සීමිත භික්ෂු පිරිසකගේ ප්‍රයෝජනය පිණිස පවතින්නට ඇති බවත්, එහෙයින්ම නිස්කලංක පරිසරයක් භාවිත කර ඇති බවත් තහවුරු කළ හැකිය. එකී සාධකයෙන් ද මෙම භූමිය හුදෙක් රාජ්‍ය පාලකයන්ගේ විනෝද උද්‍යානයකින් ඔබ්බට ගිය භාවනායෝගීන්ට වෙන් වූ භූමියක් බව තහවුරු කළ හැකි වේ.

රන්මසු උයනෙහි අංක එක දරන පොකුණට දකුණු පසින් පධානඝර සම්ප්‍රදායේ ලක්ෂණවලින් යුත් ගොඩනැගිල්ලක අවශේෂ හඳුනාගත හැකි වේ. උතුරට මුහුණලා ද්වාරය පවතින්නට ඇතැයි අනුමාන කළ හැකි ඉදිරිපස වේදිකාවේ සිට දකුණින් ඇති මණ්ඩපය වෙත ප්‍රවේශ වීම පිණිස පිහිටවූ පාලමක් දක්නට නොහැකි වූවත් ඊට ප්‍රවේශ වීම පිණිස වේදිකාවේ පිටුපසින් උතුරින් හා දකුණින් පිහිටුවා ඇති අමතර දොරටු ද්විත්වය හඳුනාගත හැකි වේ. ඊට අමතරව පධානඝර මණ්ඩපයන්හි දක්නට ලැබෙන ගොඩනැගිල්ල වටා කුඩා වේදිකාවක් ලෙසින් නිර්මාණය කර ඇති ගල් පුවරු මෙහි හඳුනාගත හැකි වේ. එහෙයින් පවතින සාධක අනුව කර නොමැති මෙම ගොඩනැගිල්ල පධානඝරයකැයි අනුමාන කළ හැකි අතර පධානඝරවල උපයෝගීතාව වෙත අවධානය යොමු කළ යුතුය. අනුරාධපුර අවධියෙහි පාංශුකූලික භික්ෂූන් කමටහන් ලබා ගනිමින් භාවනායෝගීව වාසය කිරීම පිණිස මහාවිහාරයන්ගෙන් දුරස් වූ පධානඝර ආරණ්‍ය භාවිත කළහ. ඒ අනුව රන්මසු උයනේ පවතින පධානඝරය මෙම විහාර භූමියෙහි වාසය කළ භාවනායෝගී උපාධ්‍යායන් වහන්සේලාගේ භාවිතය පිණිස නිර්මාණය කර පවතින්නට ඇතැයි අනුමාන කළ හැකි වේ.

## නිගමනය

වර්තමානයේ වෙස්සගිරිය ලෙසින් නාමීකරණය කර ඇති භූමියත් ඇතුළුව සමස්ත ඉසුරුමුණි විහාර සංකීර්ණය වෙත අවධානය යොමු කිරීමේ දී ඊට අයත් ප්‍රධාන විහාරාංග වන බෝධිඝරය වෙස්සගිරියේ ඊ ගල් රැන්දට බටහිර පසින් ද, උපෝසථඝරය ක ගල් රැන්දෙහි දකුණුපස කෙළවරේ ද, දානශාලාව ක ගල් රැන්දට නැගෙනහිරින් පිහිටි කුඹුරු මධ්‍යයේ ද, පැරණි ස්තූප ක ගල් රැන්ද මස්තකයේ සහ ඊට නැගෙනහිරින් පිහිටි පබ්බතාරාම කොටසේ ද, ප්‍රතිමා ගෘහ කිහිපයක් ද ඇතුළු ව භික්ෂු ආවාස හඳුනාගත හැකි අතර අනෙකුත් ආරාම සංකීර්ණයන්හි දක්නට ඇති අලංකාර පොකුණු මෙම විහාර සංකීර්ණයේ උතුරු කෙළවරෙහි ඇති රන්මසු උයනට ගොනුකර ඇති බව මෙම පර්යේෂණයෙන් තහවුරු කරගත හැකි විය. ඒ අනුව සමස්ත ආරාම භූමියෙහි ප්‍රයෝජනය පිණිස අලංකාර ලෙස සකස් නොකළ පොකුණු කිහිපයක් ම වගුරු සහ පතහ වශයෙන් දැනට දැකගත හැකි අතර අලංකාර ලෙස සකස්කළ පොකුණු පිහිටුවා ඇත්තේ පහසුවෙන් ම ජලය සම්පාදනය කළ හැකි රන්මසු උයන භූමියෙහි ය. සිව්වැනි මිහිඳු රජුගේ සෙල්ලිපියෙහි සඳහන් පරිද්දෙන් ම රන්මසු උයන ප්‍රමුඛ කොටගත් ඉසුරුමුණි විහාරයට අයත් පොකුණු වෙත ජලය සම්පාදනය කිරීම තිසාවැවේ මොහොල්නග සොරොව්ව භාර නිලධාරියාගේ ප්‍රධානතම කර්තව්‍ය වන්නට ඇති බවට නිගමනය කළ හැකි හෙයින් මෙය හුදෙක් රාජකීය මගුල් උයන නොව ඉසුරුමුණි විහාරවාසී භික්ෂූන්ගේ ප්‍රයෝජනය පිණිස නිර්මාණය කළ පොකුණු පද්ධතියක් බව තහවුරු කළ හැකි වේ.



රන්මසු උයනේ පොකුණක්




රන්මසු උයනේ පොකුණක්



මහාවිහාරයේ ජන්ථාඝර පොකුණ



චක්‍ර සළකුණ



කාන්තා රුව



චක්‍රය ඉදිරිපිට ඇති ආසන



රන්මසු උයනේ ලෙන්



පධානඝර සම්ප්‍රදායේ ගොඩනැගිල්ල

## ආන්තික සටහන්

01. චන්දිම බණ්ඩාර අඹන්වල, (2011), **දක්ෂිණ අනුරාධපුරයේ වෙස්සගිරිය**, කොළඹ: ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ, පි.26.

02. සෙනරත් පරණවිතාන, (2001), **පුරාවිද්‍යා පර්යේෂණ**, බොරලැස්ගමුව: විසිදුනු ප්‍රකාශකයෝ, පි.35.

03. චන්දිම බණ්ඩාර අඹන්වල, (2011), **දක්ෂිණ අනුරාධපුරයේ වෙස්සගිරිය**, කොළඹ: ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ, පි.26.

04. Inscriptions of Ceylon, (1970), Vol.1, S. Paranavitana, **Department Of Archaelogy Ceylon**, No. 76, 77, 78, 79, 80, 81, 82, 83, 84, 85, 86, 87, 88, 89, 90, 91, 92, 93, 93a, 93b, 93c,93d, 93e ලිපි බලන්න. / කොත්මලේ අමරවංශ හිමි, (1969), **ලක්දිව සෙල්ලිපි**, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ: පිටු. 103-109

05. **දීපවංශය,** (1970), සංස්.කිරිඇල්ලේ ඤාණවිමල හිමි, කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, පි.235.

06. **මහාවංශය**, (2012), සංස්:හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි සහ වෙනත්, දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, පරි:33, ගාථා:49, පි.141.

07. යූ.ඒ. බන්දුලජීව, (2016), **"වෙස්සගිරිය පුරාවිද්‍යා ස්ථාන", අනුරාධපුරය සහ මිහින්තලය**, කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, පි. 247

08. **Inscription of Ceylon**, (2001), Vol-II, part II, Archaeological Survery department, Sri Lanka, p.180.

09. **Ibid**

10. **Epigraphia Zeylanica**, Vol-IV, 1943. ed.S.Paranavitana, London: Oxford University Press. p. 133.

11. **Inscription of Ceylon**, Vol-V, (2004), part- II, Archaeological Survery department, Sri Lanka, p.259.

12. **සිංහල බෝධිවංශය**, (1999), සංස්: සුචරිත ගම්ලත් සහ ඊ.ඒ. වික්‍රමසිංහ, කොළඹ: ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ, පි.198.

13. **Inscription of Ceylon**, Vol-II, part II, op.cit, 2001.

14. **මහාවංසය**, ៖35៖46-48.152/ ៖35៖88.154,/ ៖36៖36.157.

15. **සහස්සවත්ථුප්පකරණය**, (1999), සංස්ඃ වැගම පියරතන හිමි, කොළඹඃඇස්. ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, පි. 96.

16. **රසවාහිනී,** (2004), සංස්ඃ කැලිගම විජිතනන්ද, බොරලැස්ගමුවඃ සීදේවි ප්‍රකාශන, පි. 194.

17. **සද්ධර්මාලංකාරය**, (1954), සංස්ඃ කිරිඇල්ලේ ඥාණවිමල හිමි, කොළඹඃ ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, පි. 519.

18. **Inscription of Ceylon**, Vol, V, part II, op.cit, p.259.

19. සෙනරත් පරණවිතාන, (2001), **පුරාවිද්‍ පර්යේෂණ**, බොරලැස්ගමුවඃ විසිදුනු ප්‍රකාශකයෝ, පි.35.

20. Inscription of Ceylon, Vol, V, part II, op.cit, p.259.

21. සෙනරත් පරණවිතාන, (2001), **පුරාවිද්‍ පර්යේෂණ**, බොරලැස්ගමුවඃ විසිදුනු ප්‍රකාශකයෝ, පි.35.

22. **විස්තරාර්ථ සන්න සහිත විශුද්ධි මාර්ගය**, (2004), සංස්ඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, පිටු. 127-234.

23. උදේනි වික්‍රමසිංහ සහ වාසනා ප්‍රේමචන්ද්‍ර, (2005), **පෞරාණික ස්ථාන සහ ස්මාරක**, කොළඹඃ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, පි.58.

24. මාර්ටින් වික්‍රමසිංහ, (2012), **"ලංකාවේ තන්ත්‍රවාදය හා තිසා වැව අසල යන්ත්‍ර ගල"**, **පුරාණ යුගය**, පළවෙනි කාණ්ඩය, දෙහිවලඃ තිසර පොත් ප්‍රකාශකයෝ, පිටු.70-16.

25. ජේ.බී.දිසානායක, (2018), **ඉසුරුමුණි රජ මහ වෙහෙර**, සුමිත ප්‍රකාශකයෝ, පි.69.

26. උදේනි වික්‍රමසිංහ සහ වාසනා ප්‍රේමචන්ද්‍ර, (2005), **පෞරාණික ස්ථාන සහ ස්මාරක**, කොළඹඃ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, පි.58.